76-12

# ශ්‍රී ලංකා පදනම
# இலங்கை மன்றம்
# Sri Lanka Foundation

Established under Act No. 31 of 1973
Registered under the Tertiary and Vocational Education Commission

මගේ අංකය / எனது இல / My No. – SLF/02/EDU-10/162 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date – 2026.09.16

ප්‍රධාන ලේකම් 29 SEP 2026 සබරගමුව පළාත් සභාව - රත්නපුර

ප්‍රධාන ලේකම් 30 SEP 2026 1709

ප්‍රධාන ලේකම්,
සබරගමුව පළාත් සභාව,
නව නගරය,
රත්නපුරය

මහත්මයාණෙනි / මහත්මියනි,

**ශ්‍රී ලංකා පදනම් ආයතනය - සමාජ හා ආයතනික සංවර්ධන අංශය**
**පුහුණු වැඩමුළු පිළිබඳ දැනුවත් කිරීම**

ශ්‍රී ලංකා පදනම් ආයතනය රාජ්‍ය වැඩිහිටි අධ්‍යාපන ආයතනයක් වශයෙන් රාජ්‍ය නිළධාරීන්ගේ හා සිවිල් පුරවැසියන්ගේ අධ්‍යාපන අවශ්‍යතා ඉටු කිරීම සඳහා විවිධ අධ්‍යාපන පාඨමාලා හා පුහුණු වැඩමුළු මෙන්ම ව්‍යාපෘති හා පර්යේෂණ පවත්වමින් රටේ සමාජ සංවර්ධනය උදෙසා කටයුතු කරනු ලබයි.
ඒ අනුව අධ්‍යාපනික වශයෙන් රාජ්‍ය අංශයේ නිළධාරීන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම සඳහා 2026 අවසන් කාර්තුව සඳහා පුහුණු වැඩමුළු ගණනාවක් සැළසුම් කොට ඇත. ඒ තුළින් දෙපාර්තමේන්තු, අමාත්‍යංශ හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන නිළධාරීන්ගේ ඵලදායීතාව හා කාර්යක්ෂමතාව වර්ධනය කොට සේවා ස්ථානයට උපරිම කැපවීමෙන් යුතු නිළධාරියෙක් බිහි කර ආයතනික අරමුණු ඉහළට ගෙන යාමට දායක කරවීම මෙහි අවසාන ඉලක්කය වේ.
ඒ යටතේ අප අංශය විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු වල විස්තර මේ සමග ඔබ වෙත යොමු කරන අතර ඔබ ආයතනයේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය හා අදාළ වැඩමුළු සඳහා ඔවුන්ගේ නාම ලේඛන අප වෙත එවන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

| අංකය | වැඩමුළුවේ නම | ගාස්තුව (එක් අයෙකුට) (රු.) | වැඩමුළු පැවැත්වෙන දිනය |
|---|---|---|---|
| 01. | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති | 7,500.00 | 2026 ඔක්තොම්බර් 16 |
| 02. | කැබිනට් පත්‍රිකා ලිවීම | 7,500.00 | 2026 ඔක්තොම්බර් 23 |
| 03. | මුදල් රෙගුලාසි ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද? | 7,500.00 | 2026 ඔක්තොම්බර් 30 |
| 04. | විගණන විමසුම්වලට ඵලදායීව පිළිතුරු සකස් කරන්නේ කෙසේද? | 7,500.00 | 2026 නොවැම්බර් 06 |
| 05. | ලිපිගොණු කළමනාකරණය | 5,000.00 | 2026 නොවැම්බර් 03 |
| 06. | කාර්යාල කළමනාකරණය | 5,000.00 | 2026 නොවැම්බර් 06 |
| 07. | රාජකාරී ලිපි ලිවීමේ පුහුණු පාඨමාලාව | 5,000.00 | 2026 නොවැම්බර් 10 |
| 08. | කෝප් කමිටු විමසුම් සඳහා ඵලදායී පිළිතුරු සකස් කිරීම හා කරුණු ඉදිරිපත් කිරීමේ කුසලතා සඳහා **Online** සම්මන්ත්‍රණය | 3,000.00 | 2026 නොවැම්බර් 13 |
| 09. | AI for smart Government: working smarter with Artificial Intelligence | 7,000.00<br>7,000.00 | 2026 නොවැම්බර් 17<br>2026 නොවැම්බර් 20 |
| 10. | AI Cyber security & Digital safety for government officers | 7,000.00 | 2026 නොවැම්බර් 24 |


Sri Lanka Foundation
100, Padanama Mawatha,
Independence Square,
Colombo 07,
Sri Lanka.

Tel: Chairman +94-11-2699482
Director General +94-11-2698378
Director (Academic) +94-11-2684508
General +94-11-2691814
+94-11-2695249

Fax : +94-11-2698377
+94-11-2679686
+94-11-2691028
Web : www.slf.lk
E-mail : info@slf.lk

| අංකය | වැඩමුළුවේ නම | ගාස්තුව (එක් අයෙකුට) (රු.) | වැඩමුළු පැවැත්වෙන දිනය |
|---|---|---|---|
| 11. | AI for Human Resource Management in the public sector | 7,000.00 | 2026 නොවැම්බර් 27 |
| 12. | AI for Effective presentations and Public Communication | 7,000.00 | 2026 දෙසැම්බර් 01 |
| 13. | AI Powered Report writing and official documentation | 5,000.00 | 2026 දෙසැම්බර් 04 |
| 14. | පිරිසුදු සේවා ස්ථානයක්: යහපත් රාජ්‍ය සේවාවක් | 5,000.00 | 2026 දෙසැම්බර් 08 |
| 15. | ඵලදායී සන්නිවේදනය තුළින් මහජන විශ්වාසය ගොඩ නගමු | 5,000.00 | 2026 දෙසැම්බර් 11 |
| 16. | රාජ්‍ය නිළධාරීන්ගේ සේවා අභිප්‍රේරණය | 5,000.00 | 2026 දෙසැම්බර් 15 |
| 17. | රාජ්‍ය ප්‍රසම්පාදනය | 7,000.00 | 2026 දෙසැම්බර් 18 |

ඒ ඒ වැඩමුළුව සඳහා වන ගාස්තුව යටතේ උදේ සවස කෙටි කෑම සමග තේ , දිවා ආහාරය, ලිපිද්‍රව්‍ය, අත් පත්‍රිකා, සහතික පත්‍ර, වායුසමීකරණය කරන ලද දේශන ශාලා පහසුකම් හා ප්‍රවීන සම්පත්දායකත්වය ලබා දෙන බව දන්වමු.

මෙම වැඩමුළු ඔබ ආයතනයේ ඉල්ලීම පරිදි අවශ්‍ය ආකාරයට සැළසුම් කර දිය හැකි අතර ආයතනික වශයෙන් අවශ්‍ය වන විෂය ක්ෂේත්‍ර සඳහා වැඩමුළු ද කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා සම්මන්ත්‍රණ හා විභාග සඳහා ද සූදානම් කළ හැකි බව සතුටින් දැනුම් දෙමු.

එසේම ඔබ දෙපාර්තමේන්තුවල අමාත්‍යංශය හරහා ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ප්‍රජාව වෙත ගෙන යාමේ දී අවශ්‍ය වන පුහුණු හා පර්යේෂණ හා පහසුකාරකත්වය සැපයීමට ද අප ආයතනයට හැකි බව ද දන්වමු.

මේ පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනීම සඳහා අප ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය / අංශ ප්‍රධාන - සමාජ හා ආයතනික සංවර්ධන අංශය, සරෝජිනී වික්‍රමසිංහ - 011-2691814 (281)/ 0714539484 (WhatsApp) , sarojini@slf.lk තුළින් විස්තර ලබා ගත හැකි බව කාරුණිකව දන්වමි.

ඔබ දෙපාර්තමේන්තුවේ/ අමාත්‍යංශයේ/ ආයතනයේ මානව සම්පත ඵලදායීව පුහුණු කිරීම සඳහා ඔබ දක්වන උනන්දුව ඉතා අගය කොට සළකමු.

ස්තූතියි!

මෙයට විශ්වාසී,

සරෝජිනී වික්‍රමසිංහ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - පාඨමාලා සම්බන්ධීකාරක